පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

විෂය:- නාට්‍ය හා රංග කලාව

සතිය - 08

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

02. පාඩම/ඒකකය :- 1.5.1

නාට්‍ය සංගීතය

03. ශිෂ්‍යයා කළයුතු කාර්යයන් :-

- සංගීත කොටස් ඇතුලත් නාට්‍ය සංයුක්ත තැටියකට හෝ සජීවී ගායනයකට සවන් දෙන්න.
- එම ගායනයෙන් හෝ සංගීත පසුබිම් වාදන වලින් තමාට දැනෙන සේ තවත් අයෙකුට පවසන්න.
- නාට්‍ය සංගීතය අයත් වන්නේ ආහාර්‍ය්‍ය අභිනයට වන බවත් නාට්‍ය ගීත වාචික අභිනයට අයත් වන බව තේරුම් ගන්න.
- නාට්‍යයේ ශෛලය අනුව නාට්‍ය සංගීතයද වෙනස් වන බව හඳුනා ගන්න.
- තේමාවට උචිත ලෙසින් සංගීතය යොදාගන්නා අතර නාට්‍යයේ අවස්ථා තීව්‍ර කිරීමටද එය උපයෝගි වන බව හඳුනා ගන්න.
- නාට්‍ය ගීත සඳහා යොදන සංගීතය මෙන්ම පසුබිම් සංගීතයද නළුනිළියන්ගේ රංගනය අභිබවා නොයන ලෙස යොදා ගත යුතුබව තේරුම් ගන්න.

04. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්, Website හා ඉගනුම් ආධාරක

- ❖ e - තක්ෂලාව
- ❖ e - ණැන පියස - 11 ශ්‍රේණිය නාට්‍ය හා රංග කලාව (enenapiyasa.lk)
- ❖ රංග භූමි වැඩසටහන (ජාතික රූපවාහිණිය) https://youtube.com/tlaylist?list=PLG5mYZmJYit5vw7917VjmrhO7HSUI2_OU
- ❖ වෙනත් - You tube - https//youtybe.complaylist?list=PLG5mYZmJ Yit5vw7917VjMrh07HSU12OU

05. මෙම පාඩම තුලින් ලබාගතහැකි ඉගෙනුම් ඵල:-

- ❖ නාට්‍යක සංගීතය යෙදිය යුතු ආකාරය වටහා ගනියි.
- ❖ නාට්‍ය ගීත ගායනා කරයි.
- ❖ නාට්‍යය ගීතවලට අනුව රංගනයෙහි යෙදෙයි.
- ❖ නාට්‍යයකට සංගීතය වැදගත්වන අයුරු ප්‍රකාශ කරයි.
- ❖ සංගීතය සුවිශේෂි ලෙස යොදාගෙන ඇති නාට්‍ය නරඹයි.

නිළධාරියාගේ නම :- K.A.P. ධම්මිකා
පාසල :- කෑ/ බණ්ඩාරනායක ජාතික පාසල